# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
### සෙත්සිරිපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1501 / 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023 திகதி

දිනය / Date — 02/12/2023 පැය 0830

## මාධ්‍ය නිවේදනය

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. මනුෂ්‍ය ඝාතනයකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගැනීම - සෙට්ටිකුලම පොලිස් ස්ථානය.**

2023.11.30 වන දින සෙට්ටිකුලම පොලිස් වසමේ වෙළඳසැලක් තුලදී තියුණු ආයුධවලින් කපා කොටා අඹුසැමි යුවලක් ඝාතනය කර රු.10000/- ක මුදලක් හා රන්මාලයක කොටසක් කොල්ලකෑමේ අපරාධයට අදාල සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට සෙට්ටිකුලම පොලිසිය විමර්ශනයක් ආරම්භ කර තිබුණි. ඒ අනුව 2023.12.01 වන දින අළුයම කාලයේ දී මෙම මනුෂ්‍ය ඝාතනය සම්බන්ධයෙන් සැකකරුවෙකු කිලිනොච්චිය පොලිස් වසමේ උරිත්තිරපුරම් ප්‍රදේශයේදී සෙට්ටිකුලම පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 19 ක් වන මොහොත්තාන්කුලම, සෙට්ටිකුලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

**සැකකරුගෙන් සිදුකල ප්‍රශ්න කිරීමේ දී අපරාධය සිදුකර අවස්ථාවේ දී සැකකරු ඇඳසිටි ඇඳුම් සහ කොල්ලකන ලද රන්මාල කොටස බෑගයක දමා ළිඳක ගිල්ලවා තිබිය දී පොලිසිය සොයාගෙන ඇත.**

සෙට්ටිකුලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කඩවත පොලිස් ස්ථානය.**

2023.12.01 වන දින රාත්‍රි කාලයේ කඩවත පොලිස් වසමේ ඉහළ බියන්විල ප්‍රදේශයේදී මත්ද්‍රව්‍ය ජාවාරම් කරන පුද්ගලයෙකු සම්බන්ධව කඩවත පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත සැකකටයුතු ත්‍රිරෝද රථයක් නවතා පරීක්ෂා කිරීමේදී රියදුරු සන්තකයේ තිබී **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 200 ක්,**

**මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයා ගත් බවට සැකකරනු ලබන මුදල් රුපියල් 90860/- ක්, ඩිජිටල් තරාදියක් සහ ජංගම දුරකථනයක්** සොයා ගෙන ඇති අතර, පසුව සැකකරු ත්‍රිරෝද රථයද සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු අවුරුදු 29 ක් වන වැලිවේරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කඩවත පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - හෝමාගම පොලිස් ස්ථානය.

2023.12.01 වන දින රාත්‍රි කාලයේ හෝමාගම පොලිස් වසමේ පිටිපන ප්‍රදේශයේදී හෝමාගම පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 350 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු අවුරුදු 20 ක් වන පන්නිපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හෝමාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**